# 14



# කරුණාවන්ත ඇන්ටනි මාමා



ඇන්ටනි මාමා හරි ම **කරුණාවන්ත** පුද්ගලයෙක්. අපේ තාත්තාගේ **හොඳ** මිතුරෙක්. තාත්තා ඇන්ටනි මාමාට කැමතියි. ඒ ඔහු හැමෝට ම උපකාර කරන කෙනෙක් නිසා. ඇන්ටනි මාමා සමහර **ඉරිදා** දිනවල **හිතවත්** මිතුරන්ගේ ගෙවල්වලට යනවා. ඇතැම් දිනවල අපේ ගෙදරත් එනවා. ඔහු එන්නේ පුංචි අපේ දුක සැප බලන්න; **ලස්සන** කතන්දර කියා දෙන්න. මාමා අපට වටිනා තෑගිත් **ගෙනැවිත්** දෙනවා. දවසක් මට **පරණ** ඉංග්‍රීසි පොතක් උවමනා වී තිබුණා.මම මේ ගැන ඇන්ටනි මාමාට කිව්වා. ඇන්ටනි මාමා කොළඹ ගිහිල්ලා **ගොඩක් පොත්** සාප්පුවල පොත හොයලා තියෙනවා. කොහොම හරි ඒ පොත හොයා ගෙන දවසක් ඇන්ටනි මාමා අපේ ගෙදර ආවා. එදා මට හරි ම **සතුටු** දවසක්. මම ඇන්ටනි මාමාට හුඟක් ස්තුති කළා.

"මොනව ද ඉතින් ඇන්ටනි මාමාට මම දෙන්නෙ?" මම ඇහුවා.

"මට මොකුත් එපා. දුව **ලස්සන** සින්දුවක් කියන්න. මට ඒ ඇති." ඔහු කීවා.

"ඔන්න මම කියන්නම්. අහගන්නකෝ."

අම්බිලි මාමේ ඔබ මොකද කරන්නේ
පුලුන්වලා යටින් ඉඳන් එබිලා බලන්නේ
වටින් පිටින් ඇදෙන්නේ මුහුණ ඔබේ සිඹින්නේ
සේද යොදා සෑදු වලාසළු ද කියන්නේ
පාත බලන්නේ මුව විහිදන්නේ
රිදී සිනා පපා මෙලෝ එළිය කරන්නේ
අම්බිලි මාමේ............... //

"හරි ම ලස්සනයි, දුව හරි ම ලස්සනයි."

මම **පෙරදිග** සංගීතය හදාරනවා. එය මගේ **ප්‍රියතම** විෂයයි. පසුගිය දවස්වල **අපේ** පාසලේ **අලුත් තූර්යවාදක** කණ්ඩායමට ළමයින් තේරුවා. පන්තිභාර ගුරුතුමිය ඒ **තූර්යවාදක** කණ්ඩායමට මා ද තෝරා ගත්තා. "සුජාතා බොහොම හොඳට වයලීනය වාදනය කරනවා. ගෙදර ඔයාට වයලීනයක් තියෙනවා ද?" ගුරුතුමිය ඇසුවා.

"නෑ ගුරුතුමී," මම හෙමින් කීවා.

"**තූර්යවාදක** කණ්ඩායමේ ළමයි හොඳින් පුහුණු වෙන්න ඕනෑ. දුව තාත්තාට කියලා වයලීනයක් ගන්න." ඇය කීවා.

එදා මම පාසල ඇරී ගෙදර ගියා. තාත්තා තරමක **අසනීපයෙන්** පසු වුණා. ඒ නිසා වයලීනය ගැන තාත්තාට කීවේ නැහැ. වයලීනයට **ලොකු** මුදලක් උවමනා බව මම දැනගෙන සිටියා. පසු දින පාසලේ දී **තූර්යවාදක** කණ්ඩායම පුහුණු කළා. මම **දුකෙන්** බලාගෙන සිටියා.

**සති** අන්තයේ ඇන්ටනි මාමා **අපේ** ගෙදර ආවා.

"දුව අද වෙනදාට වඩා අමුතුයි." මා දුටු ගමන් ඇන්ටනි මාමා **කරුණාවෙන්** කීවා.

"මොනවා ද ඔය තරම් කල්පනා කරන්නෙ.?"

**තූර්යවාදක** කණ්ඩායමට මා තෝරා ගෙන ඇති බව මම කීවා. එය අසා ඇන්ටනි මාමා **සතුටින්** සිනහ වුණා. ඒත් වයලීනයක් නැති නිසා මට එයින් ඉවත් වන්නට සිදු වන බව මා කීවේ **දුකෙන්**. එවිට මගේ ඇස්වලට කඳුළු ආවා. ඇන්ටනී මාමා **මගේ** හිස අතගෑවා.

දවස් කිහිපයක් ගත වුණා. එක් **පියකරු** හැන්දෑවක ඇන්ටනි මාමා **හදිස්සියෙන්** ම අපේ ගෙදර ආවා. **ඔහුගේ** මුහුණ වෙනදාටත් වඩා ලස්සනයි. මූණේ **අපූරු** හිනාවක්. ඔහුගේ එක අතක **දිග** පාර්සලයක් තිබුණා. අනිත් අතින් ඔහු **මගේ** අත අල්ලා ගත්තා.

"මෙන්න දුවට මගෙන් තෑග්ගක්."

තෑග්ග බලන තුරු මට ඉවසුමක් නැති වුණා. මම පාර්සලය ලිහා **ඉක්මනින් බැලුවා. අලුත් ම වයලීනයක්."**





## ක්‍රියාකාරකම 01



අ) ඇන්ටනි මාමා කෙබඳු කෙනෙක් ද යි විස්තර කරන වචන කිහිපයක් පාඩමෙහි එයි.
කරුණාවන්ත, හොඳ, හිතවත්, එවැනි වචන කිහිපයකි.

පුද්ගලයෙක්, දෙයක්, හෝ ස්ථානයක් විස්තර කරන මෙබඳු යෙදුම් **නාම විශේෂණ** ලෙස හැඳින්වෙයි.

ආ) පුද්ගලයන්, දේවල් හා ස්ථාන හඳුන්වන වචන (නාම පද) තුන බැගින් ලියන්න. ඒ එක් එක් වචනය ඉදිරියෙන් විශේෂණ පදය බැගින් ලියන්න.

උදාහරණ : **රෝස** මල
**උස** ගස

ඇ) පාඩම කියවා පහත සඳහන් වාක්‍යවල හිස් තැන් පිරවීමට සුදුසු වචන තෝරා ලියන්න.
பாடத்தை வாசித்து பின்வரும் வாக்கியங்களின் இடைவெளிகளை நிரப்பப் பொருத்தமான சொற்களைத் தெரிந்து எழுதுக.

i. සුජාතා ගායනයට ........................... ළමයෙකි.

ii. ඇන්ටනි මාමා .......................... කතන්දර කියා දෙනවා.

iii. සංගීතය මගේ ............................. විෂයයි.

iv. වයලීනයට ........................... මුදලක් උවමනා වේ.

v. දියණිය ............................. සංගීතය හදාරයි.

## ක්‍රියාකාරකම 02



අ) පාඩමේ හමු වන මේ යෙදුම් ඉගෙන ගන්න.
பாடத்தில் உள்ள பொதுப் பெயர்ச் சொற்களை கற்றுக் கொள்க.

**ලස්සන** කතන්දර, **වටිනා** තෑගි, **ගොඩක් පොත්** සාප්පු, **පරණ** ඉංග්‍රීසි පොතක්, **සතුටු** දවසක්, **ප්‍රියතම** විෂය, **අලුත් තූර්යවාදක** කණ්ඩායම, **ලොකු** මුදලක්, **පියකරු** හැන්දෑවක්, **දිග** පාර්සලයක්

ආ) තද කළු අකුරු යෙදුණ වචන අතුරෙන් පහක් තෝරා ගෙන වාක්‍ය පහක් ලියන්න.
தடித்த எழுத்தில் காணப்படுகின்ற சொற்களில் ஐந்தைத் தெரிவு செய்து ஐந்து வாக்கியங்கள் எழுதுக.

## ක්‍රියාකාරකම 03

අ) පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරෙන් යොදා ඇති වචන විමසා බලන්න.

1. සුජාතා **හොඳින්** වයලීනය වාදනය කරනවා.

2. තාත්තා තරමක **අසනීපයෙන්** පසු වුණා.

3. මම **දුකෙන්** බලාගෙන හිටියා.

4. ඇන්ටනි මාමා **සතුටින්** සිනහවුණා.

5. ඇන්ටනි මාමා **හදිස්සියෙන්** ම අපේ ගෙදර ආවා.

මේ වචනවලින් ක්‍රියාව ගැන යමක් කියවේ. එබඳු වචන **ක්‍රියා විශේෂණ** නමින් හැඳින්වේ.

ආ) කිසියම් ක්‍රියාවක් සිදු වන හැටි විස්තර කිරීමට ක්‍රියා විශේෂණ ගණනාවක් යෙදිය හැකි ය. පහත දැක්වෙන වගුවෙහි 'කතා කරනවා' යන ක්‍රියා පදය සමග යෙදුණු ක්‍රියා විශේෂණවල තේරුම් ඉගෙන ගන්න.

| | | | |
|---|---|---|---|
| අපි | සිංහල | හොඳින් | කතා කරනවා |
| | දෙමළ | ආසාවෙන් | |
| | ඉංග්‍රීසි | අමාරුවෙන් | |
| | | පහසුවෙන් | |
| | | ඉක්මනින් | |
| | | චතුර ලෙසින් | |
| | | ආයාසයෙන් | |

ඇ) ඉහත වගුවෙහි ඇති ක්‍රියා විශේෂණ පද යොදා වාක්‍ය ලියන්න.
மேலே அட்டவணையிலுள்ள வினை அடைமொழிச் சொற்களைப் பயன்படுத்தி வாக்கியம் அமைக்குக.

## ක්‍රියාකාරකම 04

අ) නාම විශේෂණ පද යොදමින් පන්තියේ දී ඔබ දකින දේවල් පහක් ලියන්න.
பெயர் அடை மொழிச் சொல்லைப் பயன்படுத்தி வகுப்பறையில் உங்களுக்குத் தென்படும் பொருட்கள் ஐந்தை எழுதுக.

උදාහරණය : මේසය උඩ **ලොකු** පොතක් තියෙනවා.

ආ) ක්‍රියා විශේෂණ පද යොදමින් පන්තියේ දී ඔබ කරන දේවල් පහක් ලියන්න.
வினை அடை மொழிச் சொல்லைப் பயன்படுத்தி வகுப்பறையில் நீங்கள் செய்கின்ற செயல்கள் ஐந்தை எழுதுக.

උදාහරණය : කමලේන්ද්‍රන් **පහසුවෙන්** සිංහල කියවනවා.